Build Future ..... Restore Past

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2022

வருடாந்த செயலாற்றுகை அறிக்கை - 2022

ANNUAL PERFORMANCE REPORT - 2022

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

கட்டிடத் திணைக்களம்

DEPARTMENT OF BUILDINGS

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

நகர அபிவிருத்தி மற்றும்வீடமைப்பு அமைச்சு

MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING



ගොඩනැගිලි දෙපාර්තමේන්තුව



වාර්ෂික කාර්ය සාධන වාර්තාව- 2022

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 309

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 2

1.1 හැඳින්වීම 2

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 4

1.3 ප්‍රධාන කාර්යයන් 8

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ..... 9

1.5 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ ඇති ආයතන /අරමුදල්..... 11

පරිච්ඡේදය 02 — ප්‍රගතිය හා ඉදිරි දැක්ම..... 12

2.1 2022 දක්වා අතීත කාර්ය සාධනය 12

2.2 2022 වසරේ ව්‍යාපෘතිවල සාරාංශය..... 15

2.3 උපදේශක අංශයේ කාර්ය සාධනය 16

2.4 සභාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබා දීම..... 17

පරිච්ඡේදය 03-2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 18

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය..... 19

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය..... 20

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය..... 21

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්..... 22

1.වාර්තාකරණ කාලපරිච්ඡේදය... 22
2.මිනුම්කරණ පදනම..... 22
3.ආදායම් හඳුනාගැනීම..... 22
4.දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම 22
5.දේපළ, පිරියත හා උපකරණ සංචිතය..... 22
6.මුදල් හා මුදල් සමාන දෑ..... 22

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 23

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය 23

3.6a මු.රෙ.208 ප්‍රකාරව, වෙනත්අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන..... 24

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය..... 24

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව** 25

පරිච්ඡේදය 04— කාර්ය සාධන දර්ශක..... 36

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය..... 37

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ 38

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 38

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි සඳහන් කරන්න..... 39

6.3 මානව සම්පත් කළමනාකරණය 40

පරිච්ඡේදය 07— අනුකූලතා වාර්තාව..... 41

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (PWD) යටතේ ක්‍රියාත්මක වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී ස්ථාපිත කරන ලද අතර දශක 5 ක පමණ කාලයක් පුරා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකියනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කටයුතු ක්ෂේත්‍රය තුළ පූර්ණ අධිකාරිය ඇති උපදේශක ආයතනය වෙයි. ගොඩනැගීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහ එම වැඩසටහන් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගයන් සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂඥ උපදෙස් ගැනීම පිණිස ද එය කැඳවීම කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය, මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ගැසට් නිවේදනය තුළ දක්වා ඇත. ජාතික සංවර්ධනය තුළ සහ රාජ්‍ය ගොඩනැගිලි වත්කම් සංරක්ෂණයේදී දෙපාර්තමේන්තුව අනගිභවනීය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කෙරිණි .ශ්‍රී ලංකාවේ රජයේ ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ වගකීම සම්බන්ධව අධිකාරිය සහ වගකීම ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවටයි. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සේවා වෙත විශේෂ අවධානයක් යෙදවීම තුළින් දෙපාර්තමේන්තුව තම වගකීම ප්‍රති අර්ථකතනය කරයි.

සංස්ථානික තොරතුරු

නම	-	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
නෛතික තත්ත්වය	-	පූර්ණ රාජ්‍ය ආයතනයකි
අමාත්‍යාංශය	-	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
කාර්යාලය	-	දෙවන මහල “සෙත්සිරිපාය”, බත්තරමුල්ල ශ්‍රී ලංකාව දුර. 94 11 2862588 ෆැක්ස්. 94 11 2864771 විද්‍යුත් තැපෑල info@buildingsdept.gov.lk අන්තර්ජාල ලිපිනය www.buildings.gov.lk



රූපය 1: ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම

විධායක සාරාංශය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුළ රජයේ ගොඩනැගිලිවල සැලසුම් සහ ඉදිකිරීම් සම්බන්ධව වගකියන ප්‍රමුඛ රජයේ ආයතනය ලෙස දශක 5 කට ආසන්න කාලයක් කටයුතු කරමින් සිටී. මේ වන විට, වෙනස් වෙන ආර්ථිකයට සහ තාක්ෂණයට ගැලපෙන ලෙස සංවර්ධනය කර ඇති රජයේ දෙපාර්තමේන්තු අතුරින් එකක් වීමට අප ආයතනය සමත් වී ඇත. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සේවා වෙත විශේෂ අවධානයක් යොදවමින් දෙපාර්තමේන්තුව තම වගකීම සහ මෙහෙවර ප්‍රකාශය අර්ථකථනය කරගෙන යනු ඇත.

මෙම කාර්ය සාධන වාර්තාව සකසා ඇත්තේ වැඩි දියුණු වූ කාර්ය සාධනය සඳහා ඉලක්ක සැකසීම,ශ්‍රම බලකාය අධීක්ෂණය,පාලනය සහ සමාලෝචනය,අනුකූලතාව ප්‍රදර්ශනය කිරීම, බාහිර වාර්තා සැකසීම , කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සහ ඉංජිනේරුවරුන්,සේවාදායකයන් සහ කොන්ත්‍රාත්කරුවන් අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීම යන අරමුණු සහිතවය.

අතීත කාර්ය සාධනය හා සාපේක්ෂව ගත් විට මෙම වසරේ කාර්ය සාධනය ඇගයිය යුතු මට්ටමක පවතී. කලාප 7 තුළම ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපාති සාරාංශගත කර ඇත. පුනරාවර්තන වියදම් වල සහ ප්‍රාග්ධන වියදම් වල සාරාංශය මගින් පෙන්වන පරිදි අනෙකුත් සමාන ආයතනවලට සාපේක්ෂව, නිමැවුම් පිරිවැය ඵලදායි වන අතර කාර්යක්ෂමද වේ.

වාර්ෂික ක්‍රියාකාරී වැඩසටහනේ කාර්ය සාධනය එහි ඉලක්කයට සාපේක්ෂව ගත්විට ගිවිසුම් කාලය තුළ ඉලක්කයට ළඟා වී ඇති අතර කාර්ය සාධනය සහ වැඩ ගුණාත්මක බව වැඩි කිරීමට සමාලෝචනයද සිදු කරයි. විවිධ වෘත්තිකයන්ගෙන් සමන්විත දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය, ලැබී ඇති සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් ඉහළ සේවාවන් ලබා දෙයි. උපරිම කාර්යක්ෂමතාවයක් තුලින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍යය සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව උත්සහ දරයි. විවිධ බාහිර සහ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පවත්වමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කර ගෙන යනු ලබයි. වාර්ෂික විගණන සැලසුම අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් පරිපාලනය, මූල්‍ය සහ වෙනත් කටයුතු විගණනය සිදු කරනු ලැබේ.

වර්තමාන අවශ්‍යතාවයන් සම්බන්ධව කටයුතු කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයන් නැවත සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පිළිබඳව අධ්‍යයනයක් අවශ්‍ය වූ අතර අනාගතයේදී රජයට සම්බන්ධ සියලු ව්‍යාපෘති භාර ගැනීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට ආයතනය කටයුතු කරමින් සිටී.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ජනතාවට විශිෂ්ඨ සේවාවක් ලබාදීම පිණිස සුරක්ෂිත වූද, පිරිමැසුම් දායක වූද , තිරසාර හා විශිෂ්ඨ ලෙස නිමවූ ගොඩනැගිලි පරිසරයක් රාජ්‍ය අංශ ආයතන වලට ලබා දෙමින් ගොඩනැගිලි තාක්ෂණයේ පුමුඛයා බවට පත් වීම.

මෙහෙවර

තාක්ෂණික වගකීම අපේක්ෂිත ගුණාංග හා තිරසාර බව , පිරිමැසුම්දායක බව, ගුණාත්මක භාවය, සාක්ෂාත් කරමින් තම සේවා දායකයන් පූර්ණ තෘප්තියට පත් කිරීම උදෙසා විවිධ වාත්තීන්හි එසේම තත් කාර්යයන් සඳහා ඇප කැපවූ වෘත්තිකයන් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය නිර්මාණද ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික, නඩත්තු කිරීම්, උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් වැඩි දියුණු කිරීම වස් විශිෂ්ඨ සේවාවක් සැපයීම.

අරමුණු

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා විශිෂ්ඨ සේවයක් සැපයීමට වගකීව යුතු මූලික රාජ්‍ය ආයතනය ලෙස;

- සේවාදායක අවශ්‍යතාවය සපුරමින් ඔවුන් තෘප්තිමත් කිරීම.
- ව්‍යවස්ථාපිත නියාමන අවශ්‍යතාවයන් සහ අදාල සම්මතයන්ට අනුගත වීම.
- පසුවිපරම් කිරීම ප්‍රතිපෝෂණයන් හා දැනුම් හැකියාව යාවත්කාලීන කිරීම තුලින් අපගේ සේවා සැපයීම වැඩිදියුණු කිරීමෙහිලා නිරන්තර යොමු කිරීම.
- විවිධ ක්ෂේත්‍රයන්ට අයත් වෘත්තිකයන්ගේ ගැලපීම තුලින් සම්පූර්ණ දායකත්වය ලබාදීම.
- ISO තත්ත්ව කළමනාකරණ ක්‍රමවේදයේ අවශ්‍යතාවයන්ට අනුකූල වීම හා එය නිරන්තරව වැඩිදියුණු කිරීම.

දෙපාර්තමේන්තුවේ සහතිකය

සේවාදායකයාගේ තාක්ෂණික සහ කළමනාකරණ ධාරිතාව සලකා බලමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සක්‍රිය සහයක් ලබාදෙනු ලැබේ. ඉදිකිරීම් සඳහා සහතිකයක් ලබාදීමට ඇති අවශ්‍යතාවය අපි අගය කරන අතර පහත ක්‍රියාමාර්ග තුළින් අවදානම අඩු කරගැනීමට වගකියන්නෙමු:

1. යාවජීව තාක්ෂණික මූල්‍ය / වගවීම
2. සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා බලයලත් ඉහළම වෘත්තිකයන් වෙතින් සැලසුම්
3. සියලුම රීති රෙගුලාසි සහ තත්ත්ව හා ආරක්ෂක ප්‍රමිතීන් අනුගමනය කිරීම
4. අතීත අත්දැකීම් භාවිතා කරමින් විශේෂයෙන් සංවර්ධනය කළ අති නිරවද්‍ය විෂය පථය
5. අනෙකුත් සේවා සපයන්නන්ගෙන් සැලසුම්, ලේඛන යනාදිය පරීක්ෂා කර තත්ත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම
6. කොන්ත්‍රාත් කළමනාකරණය කිරීම
7. අත්දැකීම්ලත් වෘත්තීය ව්‍යාපෘති කළමනාකරණ සේවය මඟින් වටිනාකම් කර දීම
8. කළමනාකරණ විගණනවල මතුවන ගැටළුවලදී සහය ලබාදීම
9. ගිවිසුම්ගත නීතිමය කටයුතුවලදී සහය ලබාදීම
10. තාක්ෂණික ඇගයීම් සහ ප්‍රසම්පාදන කමිටුවලට සහභාගි වී තාක්ෂණික සහය ලබාදීම
11. ඉදිකිරීම් සහ අලුත්වැඩියාවන් සඳහා ගොඩනැගිලි සඳහා මිල ගණන් සාරාංශ (*BSR)* සකස් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම

කළමනාකාරීත්ව-ධුරාවලිය

ඉංජි.එම්.එච්.එම්.ඉස්මයිල්	2022/08/21දක්වා	
ඉංජි.කේ.ජී.සන්ධ්‍යා කුමුදිනී මහත්මිය	2022/08/22 සිට	අධ්‍යක්ෂ ජනරාල්
ඉංජි.කේ.ජී.සන්ධ්‍යා කුමුදිනී මහත්මිය	2022/08/20 දක්වා රාජකාරී ආවරණ(2022/11/30 සිට)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා)
ඉංජි.ජී.එච්.හිරිමුතුගොඩ මහත්මිය		
වාස්තු විද්‍යාඥ කේ.බී. මේනක මංගලනාථ		අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන සේවා)
ඉංජි. ඒ. නවාස් ආදම්	2022/03/22 දක්වා	අධ්‍යක්ෂ
ඉංජි ජී.ආර්.එස්.බී.ගම්ලත්	2022/03/23 සිට	(ඉදිකිරීම් - කලාප 2)
ඉංජි.ඩබ්ලිව්.ඒ.ඩබ්ලිව්.අභයවර්ධන මහත්මිය	2022/03/22 දක්වා 2022/12/06 දක්වා	අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 1)
ඉංජි.එස්.එම්.මඩවලගම		
ඉංජි.කේ.ලියනගේ මහත්මිය	2022/03/22 දක්වා	
ඉංජි.එස්.බී.එස්.බණ්ඩාර	2022/03/23 සිට	අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 3)
ඉංජි. ජී.එච්. හිරිමුතුගොඩ මහත්මිය		අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ)
ඉංජි.එන්.එම්.එම්.මරික්කාර් මහත්මිය	2022/03/22 දක්වා	අධ්‍යක්ෂ
ඉංජි.එච්.එම්.ආර්.බණ්ඩාර	2022/03/23 සිට	(ප්‍රසම්පාදන හා තාක්ෂණ සංවර්ධන)
ඉංජි .ඊ.ඩී.එම්.එස්.ගුණරත්න මහත්මිය		අධ්‍යක්ෂ (විදුලි හා යාන්ත්‍රික)
එස්.ඩී.ඩී.පී. සිංහපුර මහත්මිය		අධ්‍යක්ෂ (පාලන)
නිශාන්ති ප්‍රේමතුංග මහත්මිය	2022/01/18 දක්වා	ප්‍රධාන ගණකාධිකාරී
ජී.වී.ඒ.සජීවනී මහත්මිය	2022/01/18 සිට	
කේ.ජී.බී.ප්‍රියන්ත		ප්‍රධාන අභ්‍යන්තර විගණක
වාස්තු විද්‍යාඥ ආර්.ඒ.ටී.එස්.රණතුංග මහත්මිය		අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)

සපයන සේවාවන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සේවාදායකයන්ට තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හා තම ගොඩනැගිලි, යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඇති වෙන ධාරිතා පරතරය පිරවීමට කටයුතු කරයි.

ව්‍යාපෘති යෝජනා (මෙහි කාර්යය වන්නේ සේවාදායකයා හඳුනා ගත් ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමයි)

ව්‍යාපෘති අනුමැතීන් ලබාගැනීමට සහ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සහය වීම පිණිස සේවාදායකයන් සඳහා ව්‍යාපෘති සාරාංශ, ශක්‍යතා වාර්තා, පිරිවැය ඇස්තමේන්තු සහ තාක්ෂණික සහය ලබා දීම අපි සිදු කරන්නෙමු.

කාර්ය නිෂ්ඨාව (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

සැලසුම් සැකසීම, සම්පූර්ණ කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන සියල්ල සඳහා අපි සම්පූර්ණ වගකීම භාර ගන්නෙමු. සේවාදායකයාට ඇත්තේ සිදුවිය යුතු සියල්ල සිදුවීමට අවශ්‍ය යතුර යෙදීම පමණි.

මූල්‍ය රෙගුලාසි වල දක්වා ඇති පරිදි, ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්වරයා නමට නිකුත් කෙරුණු චෙක් පතක් හෝ වැය ශීර්ෂයක් මාරු කිරීමෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අරමුදල් නිකුත් කෙරේ.

උපදේශනය (ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

අප විසින් පූර්ව කොන්ත්‍රාත් වගකීම ලෙස ශක්‍යතා වාර්තා සැකසීම, සැලසුම් සකස් කිරීම, ප්‍රමාණ පත්‍ර සැකසීම සහ ලංසු ලේඛණකරණය කරනු ලබන අතර පශ්චාත් කොන්ත්‍රාත් වගකීම ලෙස ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සපයනු ලැබේ. මෙහිදී ලංසු ක්‍රියාවලියේ වගකීම සේවාදායකයා විසින් ගනු ලැබේ.

අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

ව්‍යාපෘති කළමනාකරණය (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ/උපදේශන ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

කොන්ත්‍රාත් ආයතනය වෙත උපදේශනය සැපයීමේ වගකීම අප විසින් ගනු ලැබේ. මෙහිදී ක්‍රියාත්මක කිරීමට භාරගැනීම හෝ ඒ සඳහා සේවාදායකයාට උපදෙස් දීම සිදු කෙරේ. (ඉදිකිරීම, මෙහෙයවීම හා පැවරීම), (ඉදිකිරීම, හිමිකරගැනීම, මෙහෙයවීම සහ පැවරීම) යටතේ පුද්ගලික අංශයේ ආයෝජන වැඩසටහන් සහ රජයේ හෝ ප්‍රදායක නියෝජිත ආයතනවල සැළසුම් සහ ගොඩනැගීම් කොන්ත්‍රාත් අප විසින් භාරගනු ලැබේ. මෙය මඟින් අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

නඩත්තුව, විශේෂ අලුත්වැඩියා, වැඩිදියුණු කිරීම් (කාර්යභාරය වනුයේ සේවාදායකයාට පහසුකම් සැපයීමයි)

තත්ත්ව වාර්තා සැකසීම, නඩත්තු කාර්ය සංග්‍රහයන් සැකසීම, නඩත්තු ඇස්තමේන්තු සැකසීම, නඩත්තු ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීමට භාරගනු ලැබේ.

සිදු කෙරෙන කටයුතු සඳහා අරමුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට නිදහස් කළ යුතුය

ලබාදෙන වෙනත් සේවාවන්

අනෙක් ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් ලෙස සමර්ථ නිලධාරීන් පත්කර ඒ සඳහා සහභාගි වෙනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය

ජාතික සංවර්ධනයට දායකත්වය

අප දෙපාර්තමේන්තුව ඉදිකිරීම් අංශය තුළින් සම්පූර්ණ වශයෙන්ම රටේ සංවර්ධන කටයුතු වලට දායකත්වය සපයමින් දීප ව්‍යාප්ත ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් ලබාදීමට දෙපාර්තමේන්තුව සමත්විය.

ISO 9001:2015 තත්ත්ව සහතිකය ලබා ගැනීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රධාන ඉංජිනේරු කලාප 5 කාර්යාලය ISO 9001:2015 ක්‍රියාත්මක කරනු ලබයි.
අනෙකුත් දිස්ත්‍රික් කාර්‍යාල ISO තත්ත්වය ලබා ගැනීමට අවශ්‍ය ලියකියවිලි සකස් කරමින් සිටී.
ඉතිරිව ඇති අනෙකුත් කලාප කාර්‍යාල ISO සහතික 2023 වසරට පෙර ලබා ගැනීමට කටයුතු කොට ඇත.

ප්‍රගති සාරාංශය

2022 වසර තුළ ඉලක්කගත අගයට සාපේක්ෂව මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය 66.95 % කි.

2022 වසර තුළ මුහුණ දුන් බාධකයන්

- කාර්ය මණ්ඩලයේ හිඟකම
  - ඉංජිනේරුවන් සහ වාස්තු විද්‍යාඥයින්
  - කාර්මික නිලධාරීන් සහ සැලසුම් ශිල්පීන්
  - තාක්ෂණ සහායකයින්
  - රාජ්‍ය කළමනාකරණ සහකාර සහ සංවර්ධන නිලධාරි
  - රියදුරන්
- පහසුකම් සහ ප්‍රතිලාභ මඳ හෙයින් රජයේ සේවය තුළ නිලධාරීන් රඳවා ගැනීමේ අපහසුකම.
- වැඩ බිම් වෙත යාම සඳහා වාහන අඩුකම.
- හදිසි ව්‍යාපෘති සඳහා පැවරුම් කිරීමේ පදනම මත උපදේශන සේවා ලබා ගැනීමේ අනුමැති නොමැති වීම.
- සංචාරක බංගලා නඩත්තුව/නහාලීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- අත්හිටවූ ව්‍යාපෘති සඳහා ගෙවීම් නොකිරීම (සැලසුම් සම්පූර්ණ කිරීමෙන් පසු).
- ඉදිකිරීම් අදියර තුළ සේවාදායකයන් විසින් කරනු ලබන වෙනස් කිරීම් නිසා ව්‍යාපෘති ප්‍රමාද වීම.
- කොන්ත්‍රාත්කරුවන්ගේ සම්පත් මඳකම නිසා හා ප්‍රතිපාදන නොමැතිවීම මත කලට වේලාවට ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ අසීරුතාව.
- ප්‍රතිපාදන නොමැති වීම.
- සේවාදායකයින් විසින් ව්‍යාපෘති අනුමත කිරීමේ හා පළාත් පාලන අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදයන්.

ඉංජි.කේ.ජී.එස් කුමුදිනි
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්

1.3 ප්‍රධාන කාර්යයන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මූල්‍ය රෙගුලාසි අංක 787, 788, 789 සහ 790 යටතේ බලතල පැවරී ඇත. ඒ අනුව, තාක්ෂණික නොවන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සඳහා දෙපාර්තමේන්තුව පහත වගකීම් දරයි.

අපගේ බැඳියාවන් සමග වඩාත් අනුගත වීම පිණිස දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුමක් මඟින් එකඟතාවයකට පැමිණ සේවාවන් සපයනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

1. රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන වල වැය ශීර්ෂය තුළ සපයා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව ගොඩනැගිලි සැලසුම් කිරීම ,ඇස්තමේන්තු සෑදීම, ඉදිකිරීම් සහ අදාල පහසුකම් සැපයීම
2. ගොඩනැගීම් සඳහා උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සැපයීම.
3. රජයේ ගොඩනැගිලිවල නඩත්තුව, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම
4. රජයේ රෝහල්වල පල්දෝරු පද්ධති මෙහෙයුම හා නඩත්තුව හා එහි මනා ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම.
5. රජයේ නිවාසවල නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු
6. දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සියලු ගොඩනැගීම් කටයුතුවල තාක්ෂණික වගවීම තහවුරු කිරීම.
7. විදේශ දූත ව්‍යාපෘති.
8. බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පිළිබඳ 2018.05.25 දිනැති ගැසට් පත්‍රය අනුව සභාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබා දීම
9. අනෙකුත් ආයතන සඳහා තාක්ෂණ සහාය ලබාදීම
10. විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂක සහ අනෙකුත් ආයතන වල ශිෂ්‍යයන් සඳහා පුහුණු පහසුකම් සැපයීම
11. ගොඩනැගිලි ගාස්තු උපලේඛනය (***BSR)*** සැකසීම හා යාවත්කාලීන කිරීම.
12. ***UDA*** සාමාන්‍ය රෙගුලාසියට අනුව ගොඩනැගිලි තත්ත්ව වාර්තා සහතික කිරීම.

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. උපදේශන සේවා අංශය



2. ප්‍රසම්පාදන හා තාක්ෂණ සංවර්ධන අංශය
3. කලාප කාර්‍යාල
4. පාලන අංශය
5. මුදල් අංශය
6. අභ්‍යන්තර විගණන අංශය

MAP OF ZONAL OFFICES



රූපය 2: කලාප බෙදීමේ සිතියම

1.5 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ ඇති ආයතන / අරමුදල්

- අදාළ නොවේ -

පරිච්ඡේදය 02 — ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ආයතන ප්‍රධානී, ප්‍රධාන පරිපාලන නිලධාරි/ පරිපාලන නිලධාරී විසින් අත්සන් කළ යුතු විශේෂ ජයග්‍රහණ, අභියෝග සහ අනාගත අරමුණු කෙටියෙන් විස්තර කිරීම.

2.1 2022 දක්වා අතීත කාර්ය සාධනය



	Jan	Feb	March	April	May	June	July	Aug	Sep	Oct	Nov	Dec
2022 Target	621.95	1258.1	1895.0	1400.1	2131.8	2836.7	1751.9	2220.5	2783.8	2114.6	2626.8	3250.3
2022 Progress	232.29	473.83	647.63	903.48	1012.6	1159.3	1318.1	1447.8	1572.3	1718.6	1905.1	2176.0

රූපය 3: 2022 වසරේ ඉලක්ක සහ ප්‍රගතිය සංසන්දනය



	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022
Rehabilitation	158.08	344.80	363.13	603.43	502.77	446.62	283.49	278.61	493.71	59.92
New Buildings	1181.14	1178.21	1940.68	3313.95	4759.63	4886.74	4527.99	1672.08	2417.96	2116.12
Total	1339.22	1523.01	2303.81	3917.38	5262.40	5333.36	4811.48	1950.69	2911.67	2176.04

රූපය 4: පසුගිය දස වසර සමග සංසන්දනය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතනවල සේවාදායකයින්ට සේවාවන් සපයනු ලබයි. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ප්‍රධාන සේවාව නව ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ඉදිකිරීම් සහ පුනරුත්ථාපන ලෙස වර්ග කළ හැක. වගුව 1 සහ රූප සටහන 4 හි පෙන්වා ඇති පරිදි දෙපාර්තමේන්තුව 2013 වර්ෂයේ එහි කාර්යසාධනය රු මිලියන 1339.22 සිට 2022 වර්ෂයේදී රු මිලියන 2176.04 දක්වා ඉහළ නංවා ඇති අතර එමඟින් 2013 සිට 2022 දක්වා කාර්ය සාධනය 62% කින් වැඩි කර ඇත.

වගුව1: වාර්ෂික වැඩිවීම 2013-2022

වසර	වාර්ෂික කාර්ය සාධනය	වර්ධනය %	වර්ධනය %
	රුපියල් මිලියන	(පදනම් වර්ෂය 2013)	(පදනම් වර්ෂය පෙර වසර)
2013	1339.22		
2014	1523.01	214	14
2015	2303.81	272	51
2016	3917.38	393	70
2017	5262.40	493	34
2018	5333.35	498	1
2019	4811.48	459	-10
2020	1950.69	246	-59
2021	2911.67	317	49
2022	2176.04	262	-25



රූපය 5: කාර්ය සාධනයේ වර්ධනය

2021 සිට 2022 දක්වා දෙපාර්තමේන්තුව, 2 වගුවේ පෙන්වා ඇති පරිදි, එහි කාර්යසාධනය රු මිලියන 2911.67 සිට රු මිලියන 2176.04 දක්වා අඩු වී ඇත. පහත වගුව 2 පුනරුත්ථාපනය සහ නව ගොඩනැගිලිවල කාර්ය සාධනය පෙන්වයි. 2021 සිට 2022 දක්වා නව ගොඩනැගිලිවල කාර්ය සාධනය 13% කින් අඩු වී ඇති අතර පුනරුත්ථාපන ව්‍යාපෘති 88% කින් අඩු වී ඇත. සේවාලාභියාට ප්‍රතිපාදන නොලැබීම, කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය අර්බුදය සහ මිල ඉහළ යාම (Covid -19 වසංගතය, ඉන්ධන හිඟය, ආනයන තහනම්, රජයේ රෙගුලාසි ,විදුලි ඇනහිටීම්)හේතුවෙන් සමස්ත ප්‍රගතිය අඩු වී ඇත

වගුව 2: වාර්ෂික කාර්ය සාධනයේ ආංශික සංසන්දනය

අංශය	කාර්ය සාධනය (රු.මිලියන)		වර්ධනය % (පදනම් වර්ෂය පෙර වසර)
	2021	2022	
ප්‍රතිසංස්කරණ	493.71	59.92	-88%
නව ඉදිකිරීම්	2417.96	2116.12	-13%
එකතුව	**2911.67**	**2176.04**	**-25%**

2.2 2022 වසරේ ව්‍යාපෘතිවල සාරාංශය

දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේදී ව්‍යාපෘති 145 ක් හසුරුවා ඇති අතර එයින් ව්‍යාපෘති වටිනාකම මිලියන 25 දක්වා වූ ව්‍යාපෘති 84 ක්, ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 25 සිට මිලියන 100 දක්වා ව්‍යාපෘති 26 ක්, ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 100 සිට 200 දක්වා ව්‍යාපෘති 15කි.ව්‍යාපෘති වටිනාකම රු. මිලියන 200 වඩා ව්‍යාපෘති 20 ක් ඇති අතර 3 වගුවේ පෙන්වා ඇති පරිදි වේ.

වගුව 3: 2022 වසරේ ඉදිකිරීම් අංශයේ සාරාංශය

කලාප කාර්යාලය	**ව්‍යාපෘති වටිනාකම රුපියල් (මිලියන)**				
	0-25	**25-100**	**100-200**	**>200**	**එකතුව**
බස්නාහිර/දකුණ	09	05	03	04	**21**
බස්නාහිර/උතුර	07	04	01	06	**18**
කලාප 2	03	07	00	02	**12**
කලාප 3	16	03	03	01	**23**
කලාප 4	20	00	02	02	**24**
කලාප 5	07	01	05	04	**17**
කලාප 6	22	06	01	01	**30**
එකතුව	84	26	15	20	**145**

2.3 උපදේශන අංශයේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන සේවාවන්හි අරමුණ වන්නේ උපදේශන අංශයයි. මෙම අංශය ගොඩනැගිලි හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් හා ප්‍රමාණ බිල්පත් සම්බන්ධ වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, විදුලි, ජල සම්පාදන, ජලාපවහන සහ යාන්ත්‍රික සැලසුම් ආකාරයෙන් නිර්මාණ සේවා සපයයි. ඉහත සේවාවන් සපයනු ලබන්නේ කැපවූ වෘත්තීය ගෘහ නිර්මාණ ශිල්පීන් සහ ඉංජිනේරුවන් විසිනි. රටේ පවතින තත්වය හේතුවෙන් උපදේශන අංශය 2021 වර්ෂයේ රු.මිලියන 7688.37 සිට 2022 වර්ෂයේදී රු.මිලියන 3585.92 දක්වා සිය කාර්ය සාධනය සාක්ෂාත් කොට ගෙන ඇත. පහත වගුව 4 මගින් 2022 වර්ෂයේ ව්‍යාපෘති සංඛ්‍යාව ද, 2013 වර්ෂයේ සිට 2022 වසර දක්වා වූ කාර්ය සාධනය රූප සටහන 6 දක්වති.

වගුව 4: 2022 වසරේදී ව්‍යාපෘති උපදේශන අංශයේ සාරාංශය

අංකය	විස්තරය	ව්‍යාපෘති ගණන
1	සැලසුම් අදියරේදී සම්පූර්ණ කළ ව්‍යාපෘති	14
2	සේවාදායක අනුමැතීන් සඳහා වන දළ සැලසුම්	18
3	ඉදිකිරීම් අදියර සඳහා සැළසුම් සකස් කරන ව්‍යාපෘති	07
4	2022 වසර අවසානයේ සැකසෙමින් ඇති දළ සැලසුම්	01
5	2022 වසර අවසානයේ විමර්ශන අදියරේ පවතින ව්‍යාපෘති	02
	මුළු ව්‍යාපෘති සංඛ්‍යාව	42



රූපය 6 උපදේශන අංශයේ කාර්ය සාධනයේ ප්‍රස්තාරමය නිරූපනය කිරීම

2.4 සහාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබා දීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2018.05.25 දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද මහල් නිවාස හිමිකාරීත්ව (විශේෂ විධිවිධාන) පනතට අනුව සහාධිපත්‍ය දේපලෙහි ආරක්ෂාව සඳහා ගොඩනැගිලි සඳහා සහතික නිකුත් කිරීම සඳහා නිවාස ඒකක පරීක්ෂා කරන ලදී. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) විසින් ඉදිකරන ලද මුළු ඒකක 2063 න් නිවාස ඒකක 1325 ක් සඳහා සහතික නිකුත් කල අතර නිවාස ඒකක 710 ක පරීක්ෂාවට ලක්ව ඇත. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) සහ මහනුවර මහ නගර සභාව විසින් පිළිවෙළින් ඉදිකරන ලද නිවාස ඒකක 144 ක් හා 32ක් සඳහා 5 වගුවේ දක්වා ඇති පරිදි සහතික නිකුත් කරන ලදි. තවද හබරාදුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් ඉදිකරන ලද නිවාස ඒකක 36 ක් පරීක්ෂා කරන ලදී. පරිශ්‍රයට ප්‍රවේශ වීමට නොහැකි වීම, කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ මාර්ගගත කිරීමේ කටයුතු පැවරීමේ දුෂ්කරතා සහ ස්ථිර දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් පරීක්ෂාව ප්‍රමාද විය.

වගුව *5:* සහාධිපත්‍ය ව්‍යාපෘති

	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	**ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව**	**මහ නුවර මහ නගර සභාව**	**හබරාදුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය**
සහතික නිකුත් කරන ලද	1325	144	32	
පරීක්ෂා කරමින් පවතින	28			
පරීක්ෂා කරන ලද	710			36
සම්පූර්ණ ඒකක	2063	144	32	36

පරිච්ඡේදය 03 - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

ඒඑසිඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022		සටහන	තක්සා 2022	2021	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඑසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		1,033,698,000	1,617,444,000	ඒඑසිඒ-3
-	තැන්පතු		1,096,123,274	1,145,164,003	ඒඑසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		24,592,206	22,721,000	ඒඑසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		2,154,413,480	2,785,329,003	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		2,154,413,480	2,785,329,003	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		2,154,413,480	2,785,329,003	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
394,430,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	371,850,773	340,970,809	
133,030,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	136,578,828	116,580,991	ඒඑසිඒ-2(ii)
2,700,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	2,288,307	1,977,231	
-	පොළී ගෙවීම්	8	-	-	
200,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	116,792	128,103	
530,360,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		510,834,700	459,657,134	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
24,650,000	වැඩිදියුණු කිරීම්	10	23,494,075	32,517,501	
1,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,488,889	55,943,634	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒඑසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
900,000	හැකියා වර්ධනය	14	989,425	3,178,661	
500,000	වෙනත් මූලධන වියදම්	15	470,029	-	
27,550,000	මුළු මූලධන වියදම් (උ)		26,442,418	91,639,796	
	තැන්පතු ගෙවීම්		1,065,443,813	818,685,319	ඒඑසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		24,627,708	17,638,145	ඒඑසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,090,071,521	836,323,464	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,627,348,639	1,387,620,394	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		527,064,841	1,397,708,609	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		527,064,841	1,397,708,609	ඒඑසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒඑසිඒ-3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

ඒසිඒ-පි

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්ෂ 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	841,132,720	826,783,739
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	65,555,379	65,519,877
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		906,688,099	892,303,616
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(1,304,063,770)	(1,273,419,810)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		841,132,720	826,783,739
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	1,369,619,149	1,338,939,687
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		906,688,099	892,303,616

පිටු අංක **01** සිට **41** දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක **42** සිට **70** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරවී කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් චාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම : 23/02/2023
දිනය : 23/02/27	දිනය : 23.02.2023	දිනය :
ඩබ්ලිව්.එස්. සහ්‍යානන්ද SLAS (SPECIAL GRADE) MBA(Ballarat), PGD(La-Trobe), B.Sc.(Sri Jayawardenepura) ලේකම් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය 17 වන මහල, "සුහුරුපාය" බත්තරමුල්ල	ඉංජි.කේ.පී. සන්ධ්‍යා කුමුදිනී ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව "සෙත්සිරිපාය" බත්තරමුල්ල	පී.වී. අනුෂා සජීවනී ප්‍රධාන ගණකාධිකාරි ගොඩනැගිලි දෙපාර්තමේන්තුව "සෙත්සිරිපාය", බත්තරමුල්ල.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ඒසිඒ-සී

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	නම්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	207,251,945	121,967,518
අග්‍රිම ලැබීම්	1,033,698,000	1,617,444,000
අත්තිකාරම් අයකර ගැනීම්	22,991,433	22,065,205
තැන්පතු ලැබීම්	1,096,123,274	1,145,164,003
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	2,360,064,652	2,906,640,726
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	507,561,343	457,595,083
සහනාධාර සහ මාරුකිරීම්	2,288,307	1,977,231
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	733,498,303	1,519,095,152
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	24,830,468	17,648,145
තැන්පතු ගෙවීම්	1,065,443,813	818,685,319
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	2,333,622,234	2,815,000,930
	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	26,442,418	91,639,796
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	26,442,418	91,639,796
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(26,442,418)	(91,639,796)
	-	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනික වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1. වාර්තාකරණ කාලය
මෙම මූල්‍ය ප්‍රකාශය සඳහා වාර්තා කිරීමේ කාලය 2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වේ.

2. මිනුම් කරන පදනම
මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ඇතැම් වත්කම් නැවත තක්සේරු කිරීම මගින් වෙනස් කරන ලද ඓතිහාසික පිරිවැය මත වන අතර වෙනත් ආකාරයකින් නිශ්චිතව දක්වා නොමැති නම්, වෙනස් කරන ලද මුදල් පදනමක් මත ගිණුම්ගත කර ඇත.

3. ආදායම් හඳුනා ගැනීම.
විනිමය සහ විනිමය නොවන ආදායම් අදාළ ආදායම් කාලසීමාව නොසලකා ගිණුම්කරණ කාලය තුළ මුදල් ලැබීම් මත හඳුනා ගැනේ.

4. දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනීම සහ මැනීම (PP&E)
වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට සම්භාවිතාවක් ඇති විට දේපල, කම්හල සහ උපකරණ අයිතමයක් හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය. PP&E පිරිවැයකින් මනිනු ලබන අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන විට නැවත ඇගයීමේ ආකෘතිය යොදනු ලැබේ.

5. දේපළ, පිරියත සහ උපකරණ සංචිතය
මෙම සංචිත ගිණුම දේපල කම්හලේ සහ උපකරණවල අනුරූප ගිණුමයි.

6. මුදල් සහ මුදල් සමාන දේ
මුදල් සහ මුදල් සමානකම්වලට දේශීය මුදල් නෝට්ටු සහ 2022 දෙසැම්බර් 31 වැනි දින ලෙස අතැති මුදල් ඇතුළත් වේ.

- කිසියම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගණුදෙණු ඇති අවස්ථාවක, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ හැකි අතර, මෙම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ‘‘වාර්තා කිරීමේ පදනම’’ යටතේ ඇතුළත් කළ හැක.
- වාර්තා කිරීමේ පදනම යටතේ වාර්තා කිරීමේ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් හෙළි කළ යුතුය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු, 000.....

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය(රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුව % ලෙස
අදාල නොවේ					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ප්‍රතිපාදන(රු.)		තත්‍ය වියදම(රු.)	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසාන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්ථන	530,360,000.00	530,269,500.00	510,834,701.00	96%
ප්‍රාග්ධන	27,550,000.00	27,640,500.00	26,442,417.00	96%

3.6a **මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

අනු අංකය	අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ප්‍රතිපාදන	ප්‍රතිපාදන(රු.)		තත්‍ය වියදම්	2022/12/31 දිනට බිල්පත්	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
		මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන			
6	රාජ්‍ය සේවා කොමිෂන් සභාව	102,960.00	57,752.18	57,752.18		100
101	බුද්ධශාසන ,ආගමික, සංස්කෘතික කටයුතුඅමාත්‍යාංශය	25,233,942.28	25,142,604.05	25,141,208.16		99.99
103	ආරක්ෂක අමාත්‍යාංශය	14,490,000.00	-	-	-	-
110	බන්ධනාගාර රාජ්‍ය අමාත්‍යාංශය	229,726,000.00	185,252,341.86	185,252,341.86		100
111	සෞඛ්‍ය අමාත්‍යාංශය	28,681,710.01	26,631,034.49	26,631,034.49		100
112	විදේශ අමාත්‍යාංශය	2,017,300.00	746,365.55	746,365.55		100
130	රාජ්‍ය සේවා අමාත්‍යාංශය	1,121,893.52	-	-	-	-
186	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	37,355,000.00	37,355,000.00	37,355,000.00	-	100
208	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	96,825,942.70	37,146,487.24	34,720,827.14	2,425,660.10	93.47
220	ආයුර්වේද දෙපාර්තමේන්තුව	11,244,328.22	5,155,997.37	5,155,997.36		100
221	කම්කරු දෙපාර්තමේන්තුව	101,063,698.13	77,915,461.18	69,621,902.20	8,293,558.98	89.36
225	පොලිස් දෙපාර්තමේන්තුව	572,961,305.92	338,789,886.20	322,903,345.41	15,886,540.79	95.31
246	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	9,837,302.26	5,498,370.28	5,498,370.28		100
288	මිනින්දෝරු දෙපාර්තමේන්තුව	1,450,721.77	1,068078.52	1,068,078.52		100
289	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	2,491,000.00	2,491,000.00	2,491,000.00		100
308	තැපැල් දෙපාර්තමේන්තුව	20,000,000.00	72,410.40	72,410.10		100
	මුළු එකතුව	**1,154,602,564.81**	**743,332,789.32**	**716,715,633.25**	**26,605,759.87**	

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය **2022.12.31** දිනට (රු.)	**2022.12.31** දිනට මූල්‍ය ස්ථාන වාර්තාවේ ශේෂය (රු.)	ගණනය කිරීමට නියමිත	ප්‍රගතිය ලෙස % වාර්තා කිරීම
9151	ගොඩනැගිලි සහ ව්‍යුහ	111,146,139.29	111,146,139.29	-	100
9152	යන්ත්‍රෝපකරණ	263,883,802.68	263,883,802.68	-	100
9153	ඉඩම්	461,298,859.79	461,298,859.79	-	100
9154	අස්පෘෂ්‍යය වත්කම්	3,979,368.00	3,979,368.00	-	100
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	824,550.00	824,550.00	-	100
9180	කල්බදු වත්කම්	-	-	-	-

3.8 **විගණකාධිපතිවරයාගේ වාර්තාව**

මගේ අංකය / எனது இல. / My No. } සිඒඊ/ඒ/බීඩී/එෆ්එස්/2022/01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 309 ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 309 ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 තැන්පතු ගෙවීම්

තෙවන පාර්ශවයන් වෙත ගෙවීමට ඇති මුදල් වශයෙන් පවත්වාගෙන යනු ලබන 13/52 පොදු තැන්පතු ගිණුමේ ශේෂය වන රු.1,014,524,420 ක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව ඉකුත් වූ සියළුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් වසර 05ට වඩා වැඩි තැන්පතු රු. 16,870,929 ක් ද, වසර 02ට වැඩි තැන්පතු රු. 298,581,860 ක් ද හඳුනා ගැනීමට ලැබිණි. එහෙත් 13/52 තැන්පත් ගිණුමෙහි තැන්පතු ලද දිනය ලෙස 2022 ජනවාරි 01 ලෙස සටහන් කර තිබූ ශේෂයන්හි නිවැරදි තැන්පත් දිනයන් මීට වසර කිහිපයකට පෙර ඒවා විය. නිම කළ, අත්හිටවූ සහ ප්‍රමාද වූ කොන්ත්‍රාත්තු සඳහා ලද තැන්පත් මුදල් මේ තුල ඇතුළත්ව ඇති බව නිරීක්ෂණය විය.

(ආ) මුදල් රෙගුලාසි 571 (1) ප්‍රකාරව, සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ම, ඉකුත් වූ සියළු තැන්පතු පිළිබඳව ලැයිස්තු පිළියෙල කළ යුතු වුව ද එසේ කටයුතු කර නොතිබුණි.

1.6.2 අත්තිකාරම් ගෙවීම්

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කාර්යයන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව මියගිය නිලධාරීන්ගෙන් අය විය යුතු රු.170,275 ක ණය ශේෂයන් වර්ෂ 2 – 3 අතර කාල පරාසයක පැවතුණු අතර විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු. 115,861 ක ණය ශේෂය වර්ෂ 05 ට වැඩි කාලයක් ගත වුවද අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව සේවය අතහැර ගොස් සිටි නිලධාරීන් දෙදෙනෙකුට අදාළ මාස 03 – 12 අතර කාලයක් හිඟ හිටි ණය ශේෂය රු. 441,095 ක් වූ අතර මාස 03ට අඩු ලැබිය යුතු ණය ශේෂය රු. 242,547 ක් විය.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය ප්‍රකාශනයේ ACA – 6 ආකෘතියේ සහ භාණ්ඩාගාර SA-82 ආකෘතියේ සඳහන් මූල්‍ය නොවන වත්කම් වර්ග 10 ක 2021 දෙසැම්බර් 31 දිනට වූ ශේෂයන්ගේ එකතුව රු.309,229,711 ක් වූ අතර 2022 ජනවාරි 01 දිනට එම ශේෂයන්ගේ ආරම්භක ශේෂවල එකතුව රු. 372,890,462 ක් වූයෙන් 2022 මූල්‍ය ප්‍රකාශනයන්හි ආරම්භක ශේෂයන්ගේ රු.63,660,751 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයන්ට කළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) වත්කම් හඳුනා ගැනීම ගිණුම්ගත කිරීම හා ඒවායේ පාලනය පහසුවීම පිණිස මූල්‍ය නොවන වත්කම් වෙනුවෙන් දෙපාර්තමේන්තු අංකයක් අනුගමනය කළ යුතු වුවත් ආයතනයේ සිගාස් වැඩසටහන මඟින් ජනනය වන වත්කම් ලැයිස්තුවේ ඇති වත්කම් සත්‍ය වශයෙන්ම ආයතනය සතුව භෞතිකව පවතින වත්කම් ද යන්න තහවුරු කර ගැනීමට යම් සංකේත අංකයක් හෝ හඳුනා ගැනීමට ක්‍රමවේදයක් නොතිබුණි.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

නිල නිවාස, ගොඩනැගිලි, ප්‍රවාහන උපකරණ ඇතුළු රු.841,132,718 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් අයිතම 08 කට අදාළ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පසුගිය වර්ෂ 06 කට අදාළව ආයතනය විසින් ඉටු කිරීමට ව්‍යාපෘති 451 ක් භාර ගෙන තිබූ නමුත් කොන්ත්‍රාත් ලේඛණය යාවත්කාලීන කර කාර්යය නිම කළ දිනය යොදා නොතිබීමෙන් එම කාර්යයන් නිම කර ඇතිද යන්න තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) XIX පරිච්ඡේදයේ 4.3.4 වගන්තිය	දෙපාර්තමේන්තුවේ නිලනිවාස සම්බන්ධයෙන් එක් එක් නිවාස ශ්‍රේණිය සඳහා වෙනම පොරොත්තු ලේඛනයක් තබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii) XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය	යම් කිසි තනතුරකට නියමිත නිවාසයන් හැර අනෙකුත් සියළුම නිවාසවල බදු කාලය වර්ෂ 05ක් විය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් එම විධිවිධාන නොතකා නිවාසවල වර්ෂ 05 කට වඩා වැඩි කාලසීමාවක් නේවාසිකව සිටීම.
(iii) XIX පරිච්ඡේදයේ 6.1.1 වගන්තිය	පදිංචිය සඳහා අවසර දී ඇති සම්පූර්ණ කාල සීමාවෙන් අඩකට වැඩි කාලයක් තුළ එක් සේවා ස්ථානයක පිහිටි

	රජයේ නිවාසයක පදිංචිව සිටීමේ වරප්‍රසාද භුක්තිවිඳ ඇති නිලධාරියෙකු, එසේ කලින් පදිංචිව සිටි කාලය අවසන් කළ දිනයේ සිට වර්ෂ 05ක් ගතවන තුරු එම සේවා ස්ථානයේම පිහිටි එකී නිවාසයක් සඳහා සලකා බැලීමට නුසුදුස්සෙකු ලෙස දක්වා තිබුණද නිලධාරීන් එම විධිවිධානට පටහැනිව ක්‍රියා කර තිබුණි.
(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(iv) හා 2017.06.28 දිනැතිව නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛ අංක 01/2017	
(i) 05 වන වගන්තිය	ආයතනය සතු රු. 151,620,000 ක් වටිනාකමැති රථ වාහන පිළිබඳ තොරතුරු කොමිප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර නොතිබුණි.
(ii)07 වන වගන්තිය	කොමිප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත කාර්තුමය වශයෙන් මිළදීගැනීම් හා අපහරණයන් වාර්තා කල යුතු වුවත් එම විදිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

මුදල් රෙගුලාසි 789 ප්‍රකාරව සාමාන්‍ය නියමය වනුයේ රජයේ සියළුම නිර්මාණ හා වැඩ ක්‍රියාත්මක කිරීම පිළිබඳව රජයේ වැඩ දෙපාර්තමේන්තුව (ගොඩනැගිලි දෙපාර්තමේන්තුව) වගකිවය යුතු බවයි. මෙම කාර්යයන් හා අනෙකුත් ඉදිකිරීම් කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව 2022 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඉංජිනේරුවන් 78 කින්ද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ ගෘහ නිර්මාණ ශිල්පීන් 13 ක්ද ඇතුළුව සැලසුම් ශිල්පීන්, ප්‍රමාණ සමීක්ෂකයින් හා තාක්ෂණික නිලධාරීන් 210 කින් ද සමන්විත කාර්යමණ්ඩලයක් අනුයුක්තව සිටියද කාර්යසාධනය පහත සඳහන් පරිදි දුර්වල තත්ත්වයක විය.

3.1.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

(අ) විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ අමාත්‍යාංශය කම්කරු අමාත්‍යාංශ ගොඩනැගිල්ලට රැගෙන යාමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් එකඟතා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමටවත් කටයුතු නොකොට නිම කර භාර දිය යුතු දිනයද ඉක්මවා යන තුරුම විටින් විට කොන්ත්‍රාත්තුවෙහි ඇස්තමේන්තුගත අගයන් වෙනස් කිරීම අදාළ කාර්යයන් ඉටුකිරීම ප්‍රමාද වීමට හේතු වූ බව නිරීක්ෂණය විය.

(ආ) ඇස්තමේන්තු වටිනාකම රු.9,146,500 ක් වූ කළුතර කර්මාන්තපුරයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මුදල්ද ගෙවා තිබියදී ඉතා දීර්ඝ කාලයක් ගත කර අවසානයේ කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණු අතර ඒ සඳහා අදාළ ඉදිකිරීම් කාර්යය පිරිනැමූ ආයතනයෙහි එකඟත්වයක්ද නොවිය.

(ඇ) ඇස්තමේන්තුගත වටිනාකම රු.156,267,463 ක් වූ කොන්ත්‍රාත් 03 ක් වෙනුවෙන් වූ ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන දීර්ඝ කාලයක් ගතකර තිබුණද කොන්ත්‍රාත්තුව ඉටු කර අවසන් කර නොතිබීමෙන් වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම හා කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීම මත එම කොන්ත්‍රාත් තුනම අත්හිටුවා තිබුණි.

(ඈ) වර්ෂ 2018 සිට 2021 දක්වා ගිවිසුම් ගත වූ කයිතඩි ආර්යුවේද රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී විවේකාගාරය ඉදිකිරීම, වැල්පොතුවැව කොබෙයිගනේ මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම, කරයිතිවු ප්‍රධාන මාර්ගයේ දොරටු ඉදිකිරීම සහ වරකාපොළ කම්කරු කාර්යාලය ඉදිකිරීම යන ව්‍යාපෘති ද ගිවිසුම් ගත වී දීර්ඝ කාලයක් තුල ඉටු නොකර තබා ගනිමින් පසුව ජාතික අයවැය චක්‍රලේඛ 03/ 2022 ප්‍රකාරව 2022 වර්ෂයේ දී අත්හිටුවා තිබුණි.

(ඉ) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පසුගිය වසර 5ක කාලසීමාවක් තුල පිරිනමන ලද රුපියල් මිලියන 659 ක් ඉක්මවූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 23 ක් නිමකිරීමකින් තොරව අතරමග නවතා දමා තිබුණි.

(ඊ) මුදල් රෙගුලාසිවලටද අනුගත වෙමින් රාජ්‍ය ආයතනයක් ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව කෙරෙහිද විශ්වාසය තබමින් වෙනත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිනමනු ලබන අතර මේ වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව කළමනාකරණ ගාස්තුවක්ද අයකරනු ලැබේ.
කෙසේ වුවද මේ ආකාරයට ඉදිකිරීම් කොන්ත්‍රාත් අතරමග නවතා දැමීමත්, ඊට හේතු ලෙස උප කොන්ත්‍රාත්කරුවන් පමණක් දෝෂදර්ශණයට ලක්කිරීමත් මගින් රාජ්‍ය ආයතනයක් ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීමෙන් නිදහස් විය නොහැකි බවත් මෙම කාර්යයන් නිසිපරිදි ඉටුනොවීම මගින් රාජ්‍ය අංශය පසුබෑමකට ලක්වන බවත්, එම කොන්ත්‍රාත් සඳහා යොදවා ඇති මුදලින් නිසි ඵලයක් ලැබී නොමැති බවත් නිරීක්ෂණය විය.

3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) රජයේ නිවාසවල නඩත්තුව හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් 2022 වර්ෂයේ දී සිදු කිරීමට භාර ගෙන තිබූ ව්‍යාපෘති දෙකක ප්‍රගතිය සියයට 10ක තරම් අඩු මට්ටමක පැවතුණි.

(ආ) 2018 අගෝස්තු 15 දිනැති බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත අනුව සභාධිපත්‍ය දේපල පදිංචිය සඳහා ආරක්ෂිත බවට පරීක්ෂා කර සහතික නිකුත් කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විට නිවාස ඒකක 36ක් භෞතිකව පරීක්ෂා කර නොතිබූ අතර ඒකක 710ක පරීක්ෂණ කටයුතු නිම කර තිබුණද සහතික නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2022 වර්ෂයේ පූර්ණ ව්‍යාපෘති (Turnkey) 98ක් ලැබී තිබුණද ඉන් ව්‍යාපෘති 07ක කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණු අතර වාර්ෂික ප්‍රතිපාදනය රු.මිලියන 294.82ක් වූ ව්‍යාපෘති 11ක භෞතික ප්‍රගතිය 2% සිට 50% ත් අතර පරාසයක පැවතුණි.

(ඈ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2022 වර්ෂයේ උපදේශාත්මක (Consultancy) ව්‍යාපෘති 25ක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් ව්‍යාපෘති 04ක කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණු අතර වාර්ෂික ප්‍රතිපාදනය රු.මිලියන 431.82ක් වූ ව්‍යාපෘති 10ක භෞතික ප්‍රගතිය 3% සිට 45% දක්වා පරාසයක පැවතුණි.

3.2 වත්කම් කළමණාකරණය

(අ) 2022 දෙසැම්බර් 31 දිනට පවතින තොරතුරු වශයෙන් දෙපාර්තමේන්තුව සතු ඉඩම් පිළිබඳව කොමිප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

i. දෙපාර්තමේන්තුව සතුව ඉඩම් 45ක් පැවති අතර ඉන් ඉඩම් 13 කට හිමිකම් ඔප්පු පවතින අතර ඉතිරි ඉඩම් 32 ක් සඳහා හිමිකම් ඔප්පු පිළියෙල කර නොතිබුණි.

ii. දෙපාර්තමේන්තුව සතු ඉඩම් 45 අතුරින් ඉඩම් 25ක් සඳහා තක්සේරු වටිනාකම් වෙන් වෙන්ව හඳුනා ගත නොහැකි බව නිරීක්ෂණය විය.

(ආ) 2022 දෙසැම්බර් 31 දින වන විට නිල නිවාස 09ක් ඌන උපයෝජිතව පැවතුණි. සියලුම කලාප භාර ප්‍රධාන ඉංජිනේරුවරුන් ඇමතූ, ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 දෙසැම්බර් 27 දිනැති සහ අංක 05/13/01/18 – C III දරන ලිපිය මඟින් නිල නිවාස පරීක්ෂාව හා නඩත්තුව සම්බන්ධයෙන් උපදෙස් ලබා දී තිබියදීත් නිල නිවාසයන් කිහිපයක පැවති අඩුපාඩු හා අළුත්වැඩියා කටයුතු නොකිරීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් බොහෝ පිරිසක් පොරොත්තු ලේඛනයේ නිවාස ඉල්ලුම් කර සිටියදීත්, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු නොකිරීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) 2020 මාර්තු මාසයේ සිට සංචාරකයන් වෙත තංගල්ල සංචාරක බංගලාව ලබා නොදෙන අතර නිසි ක්‍රමවේදය යටතේ මුදල් ගෙවා වෙන්කරවා ගැනීමකින් තොරව බාහිර පුද්ගලයන් පිරිසක් රැඳී සිටීම හේතුවෙන් පහත සඳහන් පරිදි ජල හා විදුලි ගාස්තු අසාමාන්‍ය ලෙස වර්ධනය වී තිබුණු අතර බංගලාවේ නඩත්තු වෙනුවෙන් වියදම් දැරීමට සිදු වුවද කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. විදුලි හා ජල සැපයුම විසන්ධි කරන ලෙස අදාල ආයතනයන්ගෙන් 2022 ඔක්තෝබර් 18 දින අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම් කර 2023 මැයි 24 දින විදුලියද 2023 මැයි 17 දින ජලයද විසන්ධි කරන ලද අතර මෙතෙක් දැරූ ජල හා විදුලි වියදම් වූ රු. 666,447 ක් ප්‍රතිපූරණය කර නොතිබුණි.

3.3 හානි හා පාඩු

2016 සහ 2021 වර්ෂයන්හිදී සිදු වූ වාහන අනතුරු දෙකක් සම්බන්ධයෙන් ඇති වූ රු.89,597 ක් වූ පාඩුව 2022 දෙසැම්බර් 31 දිනවන තෙක්ම අයකරගෙන නොතිබුණි.

4. තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

(අ) තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2022 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රුපියල් මිලියන 288 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 567,819 ක් වී තිබුණි

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව		පුරප්පාඩු සංඛ්‍යාව
		ස්ථිර	කොන්ත්‍රාත්	
ජ්‍යෙෂ්ඨ මට්ටම	126	102	-	24
තෘතියික මට්ටම	24	05	-	19
ද්විතියික මට්ටම	285	270	-	42
ප්‍රාථමික මට්ටම	178	8	03	50
එකතුව	**613**	**505**	**03**	**135**

ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 24ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 19ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 42ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 50ක්ද වශයෙන් තනතුරු 135ක් ආයතනය තුළ පුරප්පාඩු වී තිබෙන අතර බඳවාගැනීම් කිරීමට හෝ කාර්යය ප්‍රමාණය මත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

එච්.ඒ.ඩී.චාන්දනී
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04 — කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%- 89%	50%- 74%
දළ රූප සටහන් නිර්මාණය			64.7%
සැලසුම් සටහන් නිර්මාණය		78.5%	
ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තුව			58%
ව්‍යාපෘතිය සම්පූර්ණයි (ව්‍යාපෘති ගණන)			57%
ව්‍යාපෘතිය සම්පූර්ණ කළ පදනම් අගය (ඉදිකිරීම්)			58%
ව්‍යාපෘතිය සම්පූර්ණ කළ පදනම් අගය (නඩත්තු)	98%		
ව්‍යාපෘතිය සම්පූර්ණ කළ පදනම් අගය (ව්‍යාපෘති කළමනාකරණය)			50%

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

	අරමුණු	ඉලක්ක	දර්ශකය	ප්‍රගතිය
01	රාජ්‍ය කාර්යාල සඳහා ඉදිකරන ගොඩනැගිලි වල සැලසුම් සකස් කිරීමේදී සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහතික වන ලෙස ඉටු කිරීම (SDG 03)	ඉදිකිරීම් සඳහා ගනු ලබන අමුද්‍රව්‍ය සඳහා පරිසර හිතකාමී ආරක්ෂිත ද්‍රව්‍ය භාවිතා කිරීම	ගොඩනැගිලි වල 10% කින් පරිසර හිතකාමී නොවන ද්‍රව්‍ය අඩු කිරීම.	100%
02	ඉදිකරන කාර්යාල සඳහා පානයට සුදුසු ජලය ලබා දීම හා ජල මූලාශ්‍ර වලට අප ජලයෙන් වන හානිය අවම කිරීම (SDG 06)	නව ගොඩනැගිලි සඳහා පිරිසිදු පානීය ජල සැපයුම හා අපත ජලය නිසි ක්‍රමවේදයන්ට අනුව පිරිසිදු කොට බැහැර කිරීමට ක්‍රමවේදයක් ඇති කිරීම (ආරක්ෂිත ජලය සහ සනීපාරක්ෂාව)	2022 වසරේදී ඉදිකිරීම් 25 ක් සඳහා	12%
03	කාර්යාල තුල ඉඩකඩ හා අවම පරිසරය හොඳින් නිම කිරීම (SDG 03)	ගෘහස්ථ හා පරිසර වායු දූෂණය අවම කිරීම	2022 වසරේ ඉදිකිරීම් වලින් 25 ක් සඳහා	0%
04	රාජකාරී කටයුතු පහසු කිරීම හා වේගවත් කිරීම සඳහා අන්තර්ජාල හා Network පහසුකම් සැලසීම (SDG 09)	ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම හා සම්පත් පරිහරණය කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා තොරතුරු හා තාක්ෂණ සන්නිවේදනයට ප්‍රවේශය සැලකිය යුතු ලෙස වැඩිකිරීම.	ආයතනයේ නිළධාරි ගණනෙන් 50% ක් සඳහා	100%

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවකයන් සංඛ්‍යාව	කොන්ත්‍රාත්/අනියම්	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	126	102	0	24
තෘතියික	24	5	0	19
ද්විතියික	285	270	0	42
ප්‍රාථමික	178	128	3	50
මුළු එකතුව	613	505	3	135

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි සඳහන් කරන්න.

තනතුරු වල වර්තමාන තත්වය - 2022/12/31 දිනට

<u>ජ්‍යෙෂ්ඨ මට්ටම</u>

ඉංජිනේරු සේවය - පුරප්පාඩු 11 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන ලදී.

ගණකාධිකාරී / වාස්තු විද්‍යාඥ සේවය - පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ඉල්ලීම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

අභ්‍යන්තර නිර්මාණවේදී - බඳවාගැනීමේ පටිපාටිය අනුමැතියට යවා ඇත.

<u>තෘතීය මට්ටම</u>

කාර්මික නිලධාරීන් - දෙපාර්තමේන්තුගත තනතුරු වන අතර තෘතීය මට්ටමේ නිලදාරීන්ගෙන් අදාළ සේවා (විශේෂ ශ්‍රේණිය) කාලය සම්පූර්ණ වූ පසු උසස් වීම් ලබා දී සම්පූර්ණ කරනු ලැබේ.

සැලසුම් ශිල්පී- දෙපාර්තමේන්තුගත තනතුරු වන අතර බඳවා ගැනීම් සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (විශේෂ ශ්‍රේණිය) පැවත්වීමට කටයුතු කරමින් පවතී.

<u>ද්විතීක මට්ටම</u>

සැලසුම් ශිල්පී - දෙපාර්තමේන්තුගත තනතුරු වන අතර බඳවා ගැනීම් සඳහා ලිඛිත විභාගය පවත්වා බඳවා ගැනීම් සඳහා මුදල් අමාතශයේ අනුමැතිය ඉල්ලා ඇත.

කලමණාකාර සේවා නිලධාරී - පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ඉල්ලීම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. PACIS මෘදුකාංගය යාවත්කාලීන කරනු ලැබේ.

සංවර්ධන නිලධාරී - 2022/01/01 දින පත්වීම් වලින් නිලධාරීන් 28ක් අනුයුක්ත කර ගැනීමට කටයුතු කරන ලදි.

තාක්ෂණ සහයක - දෙපාර්තමේන්තුගත තනතුරු වන අතර ,සීමිත පදනමින් නිලධාරීන් 03 ක් බඳවා ගෙන ඇත.

<u>ප්‍රාථමික මට්ටම</u>

රියදුරු - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ අනියම් පදනම මත නිලධාරීන් 03 ක් බඳවා ගෙන ඇත.

ප්‍රාථමික ශ්‍රේණිය- බහුකාර්ය සංවර්ධන බලකාය යටතේ බඳවා ගන්නා සේවකයින් අනුයුක්ත කරන ලෙස බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත.

6.3 මානව සම්පත් කළමනාකරණය

අංශය	වැඩසටහන හෝ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසට හනේ ස්වාභා වය (දේශීය /විදේශී ය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
				දේශීය	විදේ ශීය		
1	තාක්ෂණික නිලධාරීන් සඳහා කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ පුහුණුව	36	දින 2	350,000.00		දේශීය	
2	ගොඩනැගිලි සඳහා LPG පද්ධති සැලසුම් කිරීම	1	දින 4	12,000.00		දේශීය	
3	අමතර අඩු වෝල්ටීයතා පද්ධති පිළිබඳ CPD පාඨමාලාව (ELV පද්ධති)	1	දින 4	29,000.00		දේශීය	
4	2nd Government to Government G2G0 Seminar on Japanese Jonkasou for Decentralized Waste Water Management in SL	3	දින 1	ගෙවීම් නොකරන වැඩමුලුවකි		දේශීය	
5	ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව (BSE) 2020/2021	1	මාස 12	300,000.00		දේශීය	
6	කැබිනට් පත්‍රිකා සාදන ආකාරය පිළිබඳ වැඩසටහන	2	දින 1	ගෙවීම් නොකරන වැඩමුලුවකි		දේශීය	
7	ව්‍යාපෘති කළමනාකරණ වෘත්තීය (PMP) සහතිකය පිළිබඳ CPD පාඨමාලාව	1	දින 5	20,500.00		දේශීය	
8	රාජ්‍ය ප්‍රසම්පාදන සහ වත්කම් කළමනාකරණය පිළිබඳ අත්තිකාරම් සහතිකය	1	දින 10	30,000.00		දේශීය	
9	රජයේ නිලධාරියෙකුට නිවාඩු සහ නිවාඩු ලිපිකරුවන් පිළිබඳ කාර්යභාරය සහ වගකීම් පිළිබඳ වැඩමුළුව	7	දින 2	7500.00		දේශීය	
10	රජයේ නිලධාරීන්ගේ වැටුප් නියම කිරීම	8	දින 1	5,000.00		දේශීය	
11	කාර්යාල සටහන් ලිවීම සහ නිල ලිපි ලිවීම	12	දින 1	20,000.00		දේශීය	
12	වෘත්තීය පුහුණු වැඩසටහන - 40 කණ්ඩායම	1	දින 4	45,000.00		දේශීය	
13	කාර්යාලීය උපකරණ පාලනය පිළිබඳ දෙදින වැඩමුළුව	04	දින 2	7,500.00		දේශීය	
14	ප්‍රසම්පාදන සහ පාලන පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HN-DIPPCA)2021-2022	1		120,000.00		දේශීය	

07- පරිච්ඡේදය— අනුකූලතා වාර්තාව

අංකය.	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලතා දක්වයි		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලතා දක්වයි		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් මුදල්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් මුදල්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		

අංකය.	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්නාගෙන යාම	අනුකූලතා දක්වයි		
03	**මූල්‍ය පාලනය සඳහා අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූලතා දක්වයි		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලතා දක්වයි		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම	අනුකූලතා දක්වයි		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලතා දක්වයි		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලතා දක්වයි		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලතා දක්වයි		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලතා දක්වයි		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනය ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		

අංකය.	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය(අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලතා දක්වයි		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලතා දක්වයි		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූලතා දක්වයි		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලතා දක්වයි		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම	අනුකූලතා දක්වයි		

අංකය.	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලතා දක්වයි		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූලතා දක්වයි		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		
9.2	වාහන ගර්හාත වී මාස 06 කට අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූලතා දක්වයි		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලතා දක්වයි		
9.5	2016.12.29 දිනැති 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලතා දක්වයි		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූලතා දක්වයි		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
10.2	සමාලෝචිත වර්ෂයේදී හො ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලතා දක්වයි		

අංකය.	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය(අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලතා දක්වයි		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූලතා දක්වයි		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12. I	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූලතා දක්වයි		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූලතා දක්වයි		
13	**පොදු තැන්පත් ගිණුම**			
13. 1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලතා දක්වයි		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලතා දක්වයි		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලතා දක්වයි		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලතා දක්වයි		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලතා දක්වයි		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලතා දක්වයි		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
16.2	කාරය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලතා දක්වයි		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරුතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලතා දක්වයි		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාක්මක කර තිබීම	අනුකූලතා දක්වයි		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් පදනම් කරගෙන මානව සමපත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලතා දක්වයි		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලතා දක්වයි		

අංකය.	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලතා දක්වයි		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වහකිම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූලතා දක්වයි		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලතා දක්වයි		

අවසානය